**අපරාධයක වින්දිතයන් සහ සාක්ෂිකරුවන් ආරක්ෂා කිරීම සඳහා වූ ජාතික අධිකාරිය - 2022**

-----------------------------------------------------------------------------------------------

**1. මූල්‍ය ප්‍රකාශන**

**1.1 මතය**

අපරාධයක වින්දිතයන් සහ සාක්ෂිකරුවන් ආරක්ෂා කිරීම සඳහා වූ ජාතික අධිකාරියේ 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

අධිකාරියේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

**1.2 මතය සඳහා පදනම**

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේ දී, අධිකාරිය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය අධිකාරිය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැතිවිටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා අධිකාරියේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

අධිකාරියේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, අධිකාරියේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

**1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)**

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේ දී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව්කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් අධිකාරියේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව්කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

  හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කල අධිකාරියේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි

විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ අධිකාරියේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, අධිකාරිය ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

## 1.5 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.5.1 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම පිළිබඳ අභ්‍යන්තර පාලනය

ගනුදෙනු කළමනාකාරීත්වයේ පොදු සහ නිශ්චිත අධිකාරීබලය සහිතව ක්‍රියාත්මක කිරීම, අදාළ වන වාර්තාකරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට අවශ්‍ය වන පරිදි ගනුදෙනු සටහන් කිරීම සහ වත්කම් සඳහා ගිණුම්කටයුතුභාවය පවත්වාගෙන යාම, කළමනාකාරීත්වයේ පොදු සහ නිශ්චිත අධිකාරී බලය සහිතව පමණක් වත්කම්වලට ප්‍රවේශ වීම, සටහන් කරන ලද වත්කම් සඳහා වූ ගිණුම්කටයුතුභාවය පවත්නා වත්කම් සමඟ සාධාරණ කාල වකවානුවලදී සැසඳීම සහ වෙනස්කම් ඇතොත් ඒවා සම්බන්ධයෙන් නිසි පියවර ගැනීම ආදිය සඳහා සාධාරණ තහවුරුවක් ලබාගැනීමට ප්‍රමාණවත් "මනාලෙස සැලසුම් කරන ලද" අභ්‍යන්තර ගිණුම්කරණ පාලන පද්ධතියක් ආයතනය විසින් පවත්වාගෙන යාම අවශ්‍ය වේ.

## 1.6 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

| නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- | --- |
| (අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | | | |
| (i) මු රෙ 1646 | මුදල් රෙගුලාසි ප්‍රකාරව සංචිත වාහන සඳහා දෛනික ධාවන සටහන් හා මාසික සාරාංශ වාර්තා විගණකාධිපති වෙත ඉදිරිපත් කිරීමට කටයුතු කර නොතිබුණි. | සකස් කරනු ලබන සාරාංශ වාර්තා විගණකාධිපති වෙත යැවීමට උපදෙස් ලබා දුන් බව දන්වා තිබුණි. | චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කළ යුතු ය. |
| (ii) මු රෙ 1645 (අ) ඡේදය | මුදල් රෙගුලාසි ප්‍රකාරව වාහන ලොග් පොත් යාවත්කාලීන කර පවත්වාගෙන ගොස් නොතිබුණි. | ලොග් පොත්වල අඩුපාඩු සම්පූර්ණ කිරීමට උපදෙස් ලබා දුන් බව දන්වා තිබුණි. | චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කළ යුතු ය. |
| (iii) මු රෙ 315 මු රෙ 880 සහ 2020 අගෝස්තු 28 දිනැති අංක 01/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයෙහි 9 වන ඡේදය | චක්‍රලේඛ හා මුදල් රෙගුලාසි ප්‍රකාරව ඇප තැබිය යුතු නිලධාරීන් ඇප තැබීමට කටයුතු කර නොතිබුණි. | මෙම අධිකාරියේ මුදල් භාරකරුවකු (සරප්) පත්කර නොමැති අතර චෙක්පත් මඟින් ගනුදෙනු සිදුකරන බැවින් ඇප තැබීමක් සිදුකර නොමැතිබව දන්වා තිබුණි. | චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කළ යුතු ය. |
| (ආ) 2017 දෙසැම්බර් 21 දිනැති අංක 02/2017 දරන වත්කම් කළමනාකරණ චක්‍රලේඛයෙහි 2 (i) ඡේදය | අමාත්‍යාංශයෙන් අධිකාරියට ලැබුණු ජීප් රථ දෙකක් චක්‍රලේඛය පරිදි අධිකාරියට පවරාගැනීමට කටයුතු කර නොතිබුණි. | ඉදිරියේදී වාහන දෙකම පවරා ගැනීමට කටයුතු කරනු ලබන බව දන්වා තිබුණි. | චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කළ යුතු ය. |

| | | | |
|---|---|---|---|
| (ඇ) 2018 අංක 19 දරන ජාතික විගණන පනත 16 (2) වගන්තිය | පනත ප්‍රකාරව මූල්‍ය ප්‍රකාශන සමඟ වාර්ෂික කාර්යසාධන වාර්තාව ඉදිරිපත් කිරීමට කටයුතු කර නොතිබුණි. | ඉදිරියේදී මෙම කාර්යසාධන වාර්තාව මූල්‍ය ප්‍රකාශන සමඟ ඉදිරිපත් කිරීමට උපදෙස් දුන්බව දන්වා තිබුණි. | පනත ප්‍රකාරව කටයුතු කළ යුතු ය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු. 567,799 ක අතිරික්තයක් වූ අතර ඊට ප්‍රතිවිරුද්ධ ඉකුත් වර්ෂයේ ඌනතාවය රු. 4,265,483 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු. 4,833,282 ක වර්ධනයක් නිරීක්ෂණය විය. මෙම වර්ධනයට පුනරාවර්තන ලැබීම්වල රු.4,706,480 ක වැඩිවීම, අනෙකුත් ආදායම්වල රු.1,837,741 ක වැඩිවීම හා පරිභෝජන හා නඩත්තු වියදම්වල රු.1,381,721 ක අඩුවීම ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | අපරාධයක වින්දිතයන් සහ සාක්ෂිකරුවන් ආරක්ෂා කිරීම සඳහා වූ ජාතික අධිකාරි පනතේ 29 වන වගන්තියට අනුව පිහිටුවන ලද ආරක්ෂණ අරමුදලට සමාලෝචිත වර්ෂය තුළ හා ඉකුත් වර්ෂය තුළ රැස්කළ දඩ මුදල් පිළිවෙලින් රු.2,100,600 ක් හා රු.1,252,648 ක් වූ අතර, පනතේ 29 (4) වගන්තිය ප්‍රකාරව වින්දිතයින් සහ සාක්ෂිකරුවන් ආරක්ෂා කිරීම සඳහා වූ වියදම් ලෙස සමාලෝචිත වර්ෂයේ පිළිවෙලින් රු.60,456 ක් පුද්ගලයින් හතර දෙනෙකුට ද, රු.6,431 ක් පුද්ගලයින් දෙදෙනෙකු වෙත ද ගෙවා තිබුණි. ආරක්ෂණ අරමුදලේ ප්‍රධාන වියදම් ලෙස එකී පනතේ 29 (4) වගන්තිය ප්‍රකාරව ගෙවන වන්දි සැලකෙන බැවින්ද, පනතේ 2 (ඇ) වගන්තිය ප්‍රකාරව අපරාධයක වින්දිතයින්ට එරෙහිව වරදක් සිදු කිරීම නිසා වරදකරු වූ තැනැත්තන්ගේ වින්දිතයින්හට වන්දි මුදල් ලබා ගැනීමට සැලැස්වීම අධිකාරියේ අරමුණක් වන බැවින්ද, ඉහත | දැනට මෙම අරමුදලින් අධිකරණ නියෝග ප්‍රකාරව පමණක් අපරාධයක වින්දිතයන් සඳහා වන්දි ගෙවීම සිදුවන නමුත් අධිකාරිය මඟින් සෘජුවම වන්දි ගෙවීම සඳහා මාර්ගෝපදේශ මේ දක්වා ප්‍රකාශයට පත්කර නොමැති අතර, එම කටයුතු නව පනත පාර්ලිමේන්තුවේ අනුමත කිරීමෙන් පසුව සිදුකිරිමට නියමිත බව දන්වා තිබුණි. | ආදායම් රැස්කිරීමේ හා වන්දි ගෙවීමේ ක්‍රමය නිසි පරිදි ක්‍රියාත්මක කිරීමට වග බලා ගත යුතු ය. |

| | | | |
|---|---|---|---|
| | ආදායම් රැස් කිරීම හා වන්දි ගෙවීම සැලකිය යුතු ලෙස අඩුවීම නිසා ආදායම් රැස්කිරීමේ හා වන්දි ගෙවීමේ ක්‍රමය නිසි පරිදි ඉටුවී නොමැති බව නිරීක්ෂණය විය. | | |
| (ආ) | පනතේ 13 (1) (ඊ) උප වගන්තිය ප්‍රකාරව, පනතේ 29 වන වගන්තිය මගින් පිහිටුවන ලද අපරාධයක වින්දිතයින්ගේ සහ සාක්ෂිකරුවන්ගේ අරමුදලෙන් වන්දි ප්‍රදානය කිරීම සඳහා යෝජනා ක්‍රමයක් සකස්කර එය පිළිගැනීම සහ ක්‍රියාත්මක කිරීම කළ යුතු වුවත්, අධිකාරිය පිහිටුවා වර්ෂ 7ක් ගත වුව ද, ඒ අනුව කටයුතු කර නොතිබූ අතර මෙම අරමුදලෙහි 2022 දෙසැම්බර් 31 දිනට රු.16,274,850 ක ශේෂයක් පැවතිණි. | වන්දි ලබාදීමට අවශ්‍ය මාර්ගෝපදේශ මෙම පනත ප්‍රකාරව සකස් කොට කළමනාකරණ මණ්ඩලයට ඉදිරිපත් කරන ලදී. ඒ අනුව කළමනාකරණය විසින් දීර්ඝ ලෙස සාකච්ඡා කොට දැනට මෙම පනත වෙනුවට නව පනතක් පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කර ඇති බැවින් හා එම පනතේ වන්දි ගෙවීම සම්බන්ධයෙන් කරුණු ඇතුලත් කර ඇති බැවින් නව පනත අනුමතවීමෙන් පසු අවසන් මාර්ගෝපදේශ සකස් කිරීමට කළමනාකරණ මණ්ඩලය විසින් උපදෙස් ලබා දුන් බව දන්වා තිබුණි. | පනත ප්‍රකාරව කටයුතු කළ යුතු ය. |
| (ඇ) | සමාලෝචිත වර්ෂය තුළ දී ක්‍රියාත්මක කිරීමට සැලසුම්කර තිබූ වටිනාකම රු.3,300,000 ක් වූ කාර්යයන් 04 කට අදාළව කිසිදු කාර්යයක් සිදුකර නොතිබුණි. | වර්ෂය තුල ප්‍රාග්ධන වියදම් සඳහා මුදල් ප්‍රතිපාදනවලට අදාළව භාණ්ඩාගාර උපදෙස් හා චක්‍රලේඛ මඟින් යම් යම් වියදම් සීමා කිරීම හේතුවෙන් මෙම ප්‍රාග්ධන වියදම් සඳහා ඇස්තමේන්තුව යටතේ අධිකාරියේ දත්ත පද්ධතියක් සකස් කිරීමේ කාර්යය ඉවත් කොට අනෙකුත් අත්‍යාවශ්‍ය කටයුතු සඳහා ප්‍රාග්ධන වියදම් ඇස්තමේන්තු සකස් කර කළමනාකරණ මණ්ඩලයේ අනුමැතිය ලබා ගෙන ඇති බව දන්වා තිබුණි. | ආයතනයේ අපේක්ෂිත අරමුණු ඉටුවන ආකාරයට ක්‍රියාකාරී සැලැස්ම සකස් කළ යුතු ය. |

**3.2 නිෂ්කාර්ය හෝ ඌන උපයෝජිත දේපල, පිරියත හා උපකරණ**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| රැකවරණ නිවාසයක් පවත්වා ගෙන යාම සඳහා 2021 දෙසැම්බර් 27 දින වස්කඩුව ප්‍රදේශයෙන් ගොඩනැගිල්ල සමඟ ඉඩමක් රු.20,799,000 කට මිලදීගෙන තිබුණි. මගේ අංක BD/CBP/01/01/04-2022 හා 2022 අප්‍රේල් 26 දිනැති 03/2022 දරන ජාතික අයවැය චක්‍රලේඛයෙන් රාජ්‍ය වියදම් පාලනය සඳහා උපදෙස් ලබා දී තිබියදීත්, සමාලෝචිත වර්ෂයේ දී රැකවරණ නිවාසය සඳහා අවශ්‍ය ගෘහභාණ්ඩ හා අනෙකුත් උපකරණ මිලදීගැනීමට රු.1,084,977 ක මුදලක්ද, විදුලිය සඳහා 7,339 ක මුදලක්ද වැයකර තිබුණු නමුත් මෙම රැකවරණ නිවාසය උපයෝජනය නොකර නිශ්කාර්යව පැවතිණි. | රැකවරණ නිවාසය සඳහා අත්‍යාවශ්‍ය ගෘහභාණ්ඩ ලබාගැනීමට රු.697,777 ක් සහ රැකවරණ නිවාසයේ ජනෙල්වල ග්‍රිල් සවිකිරීම සඳහා රු. 387,200 ක් ලෙස රු. 1,084,977 ක මුදලක් වැය කර ඇති අතර ඊට අමතරව විදුලිය හා දුරකතන සඳහා රු. 7,339 ක මුදලක් ද වැය කර තිබුණි. කෙසේ වුවද මෙම රැකවරණ නිවාසයේ උපයෝජනය සඳහා සැලසුම් කරන ලද කාර්යය මණ්ඩලය බඳවා ගැනීමට නොහැකිවීම හේතුවෙන් (රජයේ නව බඳවා ගැනීම් නතර කිරීම හේතුවෙන්) නියමිත පරිදි කටයුතු ආරම්භ කිරීමට නොහැකි වූ බව දන්වා තිබුණි. | කාර්යය මණ්ඩලය බඳවා ගෙන හැකි ඉක්මනින් රැකවරණ නිවාසය ආරම්භ කිරීමට කටයුතු කළ යුතු ය. |

**3.3 මානව සම්පත් කළමනාකරණය**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට අනුමත කාර්ය මණ්ඩලය 56 ක් වූ අතර, එදිනට තථ්‍ය කාර්ය මණ්ඩලය 34 ක් වූයෙන්, තනතුරු 18 ක පුරප්පාඩු පැවතිණි. | 2021 අගෝස්තු 28 දිනැතිව මුදල් අමාත්‍යාංශය විසින් නිකුත් කර ඇති චක්‍රලේඛය යටතේ සියළුම බඳවා ගැනීම් තාවකාලිකව අත්හිටුවීමට සිදු වීම නිසා පුරප්පාඩු පිරවීමට නොහැකි වූ බව දන්වා තිබුණි. | පුරප්පාඩු පිරවීමට කටයුතු කළ යුතු ය. |
| (ආ) අධිකාරිය සතු රැකවරණ නිවාසය සඳහා රැකවරණ නිලධාරියකු අනුමතකර තිබුණද, ඒ සඳහා නිලධාරියෙකු පත්කර නොතිබුණි. | රජය විසින් රාජ්‍ය සේවයට බඳවා ගැනීමේදී අග්‍රාමාත්‍ය ලේකම් කාර්යාලයේ විශේෂ කමිටුවක අනුමැතිය ලබාගැනීම කළයුතු වන බවට ගෙන තිබූ තීරණය අනුව කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව හරහා එය යොමු කළ ද, එම බඳවා ගැනීමට අනුමැතිය මෙතෙක් ලැබී නොමැතිබව දන්වා තිබුණි. | රැකවරණ නිලධාරියකු කඩිනමින් බඳවා ගැනීමට කටයුතු කළ යුතු ය. |